සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு
Ministry of Education, Information Technology & Cultural Affairs
Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / My Number – ME/E/11/08/2-2වෙළම

ඔබේ අංකය / உமது இல / Your Number –

දිනය / திகதி / Date – 2024/05/09

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියළුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරු හා
සියළුම විදුහල්පතිවරුන් වෙත.

**<u>සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ වන ආයතනවල අනධ්‍යයන කාර්ය මණ්ඩල වාර්ෂික ස්ථාන මාරු අභියාචනා සමාලෝචන කමිටුවේ තීරණ දැනුම්දීම- 2023(2024)</u>**

උක්ත කාරණය සම්බන්ධයෙන් වූ මගේ සමාංක හා 2024.03.01 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කළ 2023(2024) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ වාර්ෂික ස්ථාන මාරු වලට අදාළ අභියාචනා සමාලෝචන කමිටුවේ තීරණ ඇමුණුම් 01 හි දක්වා ඇත.

02. ඒ අනුව අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ස්ථාන මාරුවීම් ලද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයින් වහාම මුදාහැරීමට ආයතන ප්‍රධානීන් විසින් කටයුතු කළ යුතුය.

03. නව සේවා ස්ථානයට වාර්තා නොකරන හා නව සේවා ස්ථානයෙහි රාජකාරි භාර ගැනීමට හැකිවන සේ ආයතන ප්‍රධානීන් එම නිලධාරීන් මුදා හැරීමට කටයුතු නොකරන අවස්ථාවන්හිදී ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව <u>අවධාරණය කරමි.</u>

04. වාර්ෂික ස්ථාන මාරුවීම් ලැබූ එක් එක් සේවක මහත්ම මහත්මීන් හට වෙන් වෙන් වශයෙන් ස්ථාන මාරුවීම් ලිපි මෙම අමාත්‍යාංශය මගින් නිකුත් කරනු නොලබන අතර අදාළ කලාප අධ්‍යාපන කාර්යාලය මගින් විධිමත් ස්ථාන මාරු ලිපියක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. එසේ මුත් ස්ථාන මාරු ලද සේවක මහත්ම මහත්මීන් එලෙස විධිමත් ස්ථාන මාරු ලිපියක් ලැබෙන තෙක් නොසිට විධිමත් පරිදි මුදාහැරීමට අවශ්‍ය කටයුතු කළයුතු බව අවධාරණය කරමි.

බී.ඒ.සී.පී.බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව

බී.ඒ.සී.පී. බමුණුආරච්චි
ලේකම්
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ සහ
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
නවනගරය - රත්නපුර